දුරකථන ) 2698475
தொலைபேசி ) 2675449
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2694860
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk

මගේ අංකය ) TA/01A/18/2014 – (කාව)
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය ) 2014.12.12
திகதி )
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
**SUWASIRIPAYA**

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ අංක : 02-174/2014

සියළුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
ශ්‍රී ලංකා ජාතික රෝහලේ අධ්‍යක්ෂ,
සියළුම පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ශික්ෂණ රෝහල් සහ මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
වෛද්‍ය අධිකාරිවරුන්,
අදාල ආයතන ප්‍රධානීන්,

<u>වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ I ශ්‍රේණියේ උසස්වීම් ලබාදීම.</u>

අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක 12/0358/509/015 හා 2014.09.19 දිනැති ලිපියෙන් දැනුම් දුන් 2014.09.04 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ප්‍රතිපත්තිමය කරුණක් සේ සලකා ගනු ලැබූ තීරණය අනුව පහත සඳහන් පරිදි කටයුතු කල යුතු බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/EST/3/1/93/2012 හා 2014.11.28 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.

I. 2006-01-01 දින සිට 2010-10-31 දින දක්වා කාලය තුළ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ II 'අ' ඛණ්ඩයේ වසර හයක (06) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත මුල් පත්වීමේ දින සිට අවම වශයෙන් වසර දොළහක (12) සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරින් හිඟ වැටුප්, අතිකාල දීමනා හා අනෙකුත් දීමනා ගෙවීමකින් තොරව I ශ්‍රේණියට උසස් කිරීම.

ඒ අනුව 2006-01-01 දින සිට 2010-10-31 දින දක්වා කාලය තුළ ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද විශ්‍රාමලත් නිලධාරින් ද ඇතුළුව වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ නිලධාරින්ගෙන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීමේදී මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍ර වලට අනුකූලව එනම්, දැනට සේවයේ නියුක්ත නිලධාරින් සඳහා ආකෘති පත්‍රය 01 ද, විශ්‍රාම ගොස් සිටින නිලධාරින් සඳහා ආකෘති

පත්‍රය 02 ද, මගින් අයදුම් කිරීමට දැනුවත් කරන ලෙස දන්වමි. අයදුම්පත්‍රයෙහි තනතුර ලෙස සඳහන් වන ස්ථානයේ නිලධාරියා දරන තනතුර පැහැදිලිව සඳහන් කර තිබිය යුතු අතර විශ්‍රාමික නිලධාරීන්ගේ අයදුම්පත්‍ර අවසන් වරට සේවය කල ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය.

ඉහත අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් සුදුසුකම්වලට පරිබාහිරව නිර්දේශ කරන අයදුම්පත් සම්බන්ධ වගකීම අදාල ආයතන ප්‍රධානියා විසින් පෞද්ගලිකව දැරිය යුතුය.

විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර ඔබගේ නිර්දේශ සහිතව "අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ- 10 " යන ලිපිනයට යොමු කිරීමට කටයුතු කරන්නේ නම් මැනවි.

ඉහත පරිදි උසස්වීම් ලබාදීමේදී වැටුප් සැකසීම කළ යුතු වන්නේ ඉහත සඳහන් වූ අමාත්‍ය මණ්ඩල තීරණයට අදාල "වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ I ශ්‍රේණියේ උසස්වීම් ලබාදීම" යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අනුමැතිය ලද 2014.09.04 දින සිට බව ද දන්වමි.

මෙම චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳ අදාල වන සියළු පාර්ශවයන් දැනුවත් කිරීමටද කාරුණික වන්න.

සුධර්මා කරුණාරත්න,
සෞඛ්‍ය ලේකම්.

පිටපත : ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කාරුණික දැනගැනීම සඳහා.